

**තහනම් උත්තේජක අඩංගු ඖෂධ ගැන්ම නිසා ක්‍රීඩා තහනමට ලක්ව සිටින සුපිරි ක්‍රිකට් ක්‍රීඩක උපුල් තරංග**

උද්ඝෝෂණයකදී කොල්ලුපිටියේ දී වෙඩි වැදී අපවත්වුණු දඹරාවේ රතනසාර හිමි, 1973 දී පේරාදෙනිය විශ්වවිද්‍යාල යේ ශිෂ්‍ය උද්ඝෝෂණ වලින් මියගිය නිහාල් විජේසූරිය, කණ්ඩලම විරෝධතා දැක්වීමේ දී මරුමුවට පත් සරත් ආදී අය ඒ අතර වෙති. එදා ඒ මරණ වලින් ඇති වූ අවුල් තවමත් නිරවුල් වූ බවක් නොපෙනේ.

අවුල් දැන් ජාතික ක්‍රීඩාවන්ටද අවතීර්ණ වී ඇති බව පෙනේ. දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙකු වූ උපුල් තරංග තහනම් උත්තේජක භාවිතා කළායයි චෝදනාවක් ඇත. ඔහුට ලබා දුන් බෙහෙත් නිසා මෙය සිදුවූ බව පැවසේ. එම බෙහෙත් වට්ටෝරුවට තහනම් උත්තේජක අඩංගු වී ඇත. ශ්‍රීලංකාවේ කසාය බෙහෙත් ආදියට සමහර විට කංසා ද අඩංගුය. බොහෝ දෙනාගේ චෝදනාවට ලක් වන්නේ වටිනා ක්‍රීඩකයෙකු වූ උපුල් තරංග වුවත් ඔහුට බෙහෙත් දුන් නිල වෛද්‍යවරයාගෙන් කිසිවෙකුත් කිසිවක් නොවිමසයි. ඉතින් එතැන ද ඇත්තේ අවුලක් නොවේද?

කුමන මිම්මෙන් බැලුවත් මේ දින වල ශ්‍රීලංකාව ජාත්‍යන්තරයේ බැබ ලෙන්නේ ක්‍රිකට් ක්‍රීඩාව නිසාය. මෙම තත්වය අවුල් කරගත යුතුද? ශ්‍රීලංකා ක්‍රීඩකයින් ක්‍රිකට් ක්‍රීඩාව සල්ලිවලට පාවාදීමේ කතාවද එවැනිම අවුලකි.

♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Oxford UK**

# ලංකා පොලිස් ඉතිහාසයේ මහා ශෝක දිනය ජුනි 11 දා

**1990** ජුනි මස 11 වන දා දවස ශ්‍රී ලංකා පොලිස් ඉතිහාසයේ අතිශය ශෝකජනක දිනය වශයෙන් සටහන් වෙයි. මන්ද එදින එල්ටීටීඊ කොටි ත්‍රස්තවාදීන් උතුරු නැගෙණහිර පොලීසි වල සේවයේ නියුක්තව සිටි පොලිස් භටයින් 600ක් එකතුකරගෙන විත් එක්වරම ඝාතනය කළ නිසාය. එසේ වූයේ කෙසේදැයි කෙනෙකු අසන්නට පුළුවන. එය සිදුවූයේ මෙසේය.



1990 දී එවකට තිබුණේ ප්‍රේමදාස රජයයි. රජය හා කොටි අතර වූ සාම සාකච්ඡා බිඳ වැටෙමින් තිබිණ. 1990 ජුනි මස 11 වන දින කොටි සංවිධානය මඩකලපුව, වෙල්ලාවෙලි, කල්මුණේ, වාලච්චෙනෙයි, සමන්තුරේ, එරාවූර් සහ අක්කරපත්තුව යන නගරවල පොලීසි වට කළහ. ඒ දවස අවසානය වන විට ඒ සියල්ලම උන් යටතට පත්විය. ආයුධ තබා එළියට බැස පිටවී යන ලෙස කොටි පොලිස් නිලධාරීන්ට නියෝග කළහ. එසේ කරන ලෙස රජය ද පොලීසි වලට කීවේය. කොටි රජයට පොරොන්දු වූයේ එම පොලිස් භටයින්ට කිසිදු හිරිහැරයක් නොකරන බවට ය.

කොටි ඒ සෑම පොලීසියකින්ම පිටවුණු භටයින් එකතුකරගන ඔවුන්ගේ දෑත් පිටුපසට තබා බැඳ එක් තැනකට රැගෙන ගියෝය. ඉතා අමානුෂික අන්දමට ඒ හයසීයටම වෙඩිතබා මරා දැමුවෝය.

♦ **රසික සෝමරත්න**
**Sri Lanka**

# ප්‍රධාන සංඝනායක පදවියෙන් පිදුම් ලද කැප්පිටියාගොඩ ගුණවංශ නාහිමියෝ



බුදුරජාණන් වහන්සේ භික්ෂූන්වහන්සේලාට දේශනා කළේ තමන්ගේ විමුක්තිය සලසාගන්නා අතරම ලෝකවාසී බොහෝදෙනාගේ හිතසුව පිණිස කටයුතුකරන ලෙසයි.

මීට වසර තිස් එකකට පෙර විදේශීය ධර්මදූත සේවාව ආරම්භ කළ බර්මිංහැම් හි ජේතවන විහාරාධිපති පූජ්‍ය කැප්පිටියාගොඩ ගුණවංශ නාහිමියන් එකී බුදුවදනට අනුව ක්‍රියාකරන යතිවරයාණන් වහන්සේ කෙනෙක් ලෙස හැඳින්විය හැකිය. ඒ හිමියන්ගේ විදේශ ධර්මදූත සේවාව අගය කරමින් ශ්‍රීලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නාහිමියෝ ප්‍රමුඛ සංඝ සභාව උන්වහන්සේට ජාත්‍යන්තර ධර්මදූත වංශ ප්‍රදීප ගෞරව නාමය සහිත එක්සත් රාජධානියේ ප්‍රධාන සංඝනායක පදවිය පිරිනැමූහ. එහි අක්තපත්‍ර ප්‍රදානය අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුරාධපුර ශුද්ධ නගරයේදී පසුගිය දා සිදු කරන ලදී.

එක්සත් රාජධානියේ වෙසෙන කෘතහස්ත දායක දායිකාවෝ අභිනව සංඝනායක නාහිමියන් පිළිගැනීමේ මහෝත්සවයක් 2011 ජුනි 5 වෙනි දින ලන්ඩනයේ හවුන්ස්ලෝහි ෆෙල්තම් සම්මන්ත්‍රණ ශාලාවේ සංවිධානය කර තිබූහ.

මේ සටහන ඒ වෙනුවෙනි.

ශාසන ශුභසිද්ධියත්, සමාජ මෙහෙවරත් වෙනුවෙන් කැපවී ක්‍රියාකරන අප නා හිමියෝ දකුණු සිරිලක ගාලු දිස්ත්‍රික්කයේ කැප්පිටියාගොට නමැති සුන්දර පින්බිමේ ප්‍රභූ පවුලක් වූ ගනේවත්ත කංකානම්ගේ ඒබ්‍රහම් හා ජාගොඩගේ පියවතී යන දෙපළට දාව 1953 නොවැම්බර් 12 වන දින උපත ලැබූහ.

ගාල්ලේ නාගොඩ මහා විද්‍යාලයෙන් මූලික සිප්සතර හදාරා කෝර්ළේගම පියනන්ද හා මාපලගම සිරිසාගර යන නාහිමි වරුන්ගේ ආචාර්‍ය්‍ය උපාධ්‍යාත්වයෙන් උතුම් පින්බර පැවිදි දිවියට පත්වූහ.

පැවිදි දිවියේ මූලික අධ්‍යාපනය ඇතුමලේ විද්‍යාතිලක පිරිවෙන තුළින් ද, උසස් අධ්‍යාපනය මරදාන ශ්‍රීලංකා පිරිවෙන තුළින් ද ලැබ සුපේශල ශික්ෂාකාමී ආදර්ශමත් පැවිදි දිවියට මග හෙළි පෙහෙළිකර ගනිමින් ගුණවංශ හිමියෝ 1976 ජූලි 30 වන දින කළුතර කළුගඟේ උදකුක්ඛේප සීමා මාලකයේ දී උතුම් වූ උපසම්පදාව ලබාගත්හ. එවකට ශ්‍රීලංකා මහ පිරිවෙණේ අධිපතිත්වය හෙබවූ ගිහි පැවිදි දෙපිරිස අතර මහා සම්භාවනාවට පාත්‍රවූ පඬිරුවනක් ලෙස සැලකෙන බද්දේගම විමලවංශ අනුනාහිමියන්ගේ සෙවන ලැබීමෙන් දෙස් විදෙස් උගතුන් බුද්ධිමතුන් හා සමාජයේ වැදගත් පිරිස සමග කටයුතු කිරීමේ මහඟු අවස්ථාව අප මහ නාහිමියන්ට ලැබීම භාග්‍යයකි.

ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධියත්, කොළඹ විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපන ඩිප්ලෝමවත් ලැබ, මරදාන ශ්‍රීලංකා මහපිරිවනේ හා ගාල්ල මාපලගම ශ්‍රී සුනන්ද මහා විද්‍යාලයේ ආචාර්යවරයෙකු ලෙසත් දහස් ගණන් ගිහි පැවිදි සිසුන්ට ධර්මඥානය ලබාදෙමින් උන්වහන්සේ කළ සේවය ප්‍රශංසනීයයි.

1979 දී ඉන්දීය මහා මහින්ද ධර්මදූත සංගමයට එක්ව එහි ක්‍රියාකාරී අනුශාසකයෙකු ලෙස එරටේ ද්‍රවිඩ, හින්දු, කර්ණාටක ජනකොටස් තුළ ආගමික අධ්‍යාපනික ප්‍රබෝධය උදෙසා අප නාහිමියෝ කටයුතු කළහ.

එක්සත් රාජධානියේ බර්මිංහැම් නගරයේ අම්බෙඩ්කාර් බෞද්ධ සංගමයේ ආරාධනයෙන් එවකට ඉන්දීයයන් සතුව තිබූ වර්තමාන ජේතවන විහාරයට 1995 දී ගුණවංශ නාහිමියන් වැඩම කිරීමෙන් පසුව එය ශ්‍රීලාංකික බෞද්ධයන්ගෙන් සැදුම්ලත් කොමිටියක පාලනයට නතුවිය. ඒ පළාතේ ජනතාවගේ ආගමික හා සාමාජයික අවශ්‍යතා ඉටුකරමින් ජේතවන විහාරස්ථානය දින දින දියුණුව කරා යන්නට වීය. ලාංකික දරුවන්ගේ දහම් දැනුම හා භාෂා දැනුම වඩවන දහම් පාසැලක් ඇරඹුණි. එසේම වාර්ෂිකව සිංහළ අවුරුදු උත්සවයක් පවත්වමින් සංස්කෘතික අංශයෙන්ද, සීල ව්‍යාපාර, භක්තිගීත ගායනා, ධර්ම දේශන මාලා සහ ධර්ම සාකච්ඡා ආදිය මෙහෙයවමින් බෞද්ධ ජනතාවගේ අධ්‍යාත්මික සංවර්ධනයද, එසේම, වෛද්‍ය සායන පැවැත්වීමෙන් කායික දියුණුවද ආදී සියල්ල නාහිමියන්ගේ අනුශාසකත්වය තුළින් සංවිධානය වූ බව කිව යුතුය.

පසුගිය සුනාමි ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් නිවාස කීපයක් ඉදිකර ඔවුන්ට දීමත්, වසරක් පාසා දුප්පත් පවුලක් තෝරා ඔවුනට නිවසක් තනාදීමත්, ආබාධිතයන්ට රෝදපුටු පරිත්‍යාග කිරීමත්, වැඩිහිටි නිවාස හා ළමා නිවාස ආදියට උදව් උපකාර කිරීමත් ආදිය අප නාහිමියන් සිය මව්බිමට කරන සේවාවන් අතරින් කීපයකි. එසේම අධ්‍යාපනය සඳහා ශ්‍රීලංකාවෙන් එක්සත් රාජධානියට පැමිණෙන ගිහි හා පැවිදි දෙපිරිසටම ලැබෙන සහයෝගය හා අනුබලය පැසසිය යුතුව ඇත.

එසේම උන්වහන්සේ එක්සත් රාජධානියේ අනෙක් විහාරස්ථානයන්හි භික්ෂූන් වහන්සේලා හා එක්ව ආගමික සාමාජයික කාර්යයන්හි යෙදෙති. මෙහිදී මේ සියළු කටයුතු සඳහා විහාරාධිකාරී ශාස්ත්‍රපති මාපලගම සෝරත ස්වාමීන් වහන්සේ දෙන සහයෝගය ද සිහිපත් කළ යුතුවෙයි.

"දුල්ලභංච මනුස්සත්තං" යන බුද්ධපාඨය අනුව සැබැවින්ම මනුෂ්‍ය ආත්මභාවය අතිශය දුර්ලභ සම්පතකි. එහෙත් එය මානව වර්ගයාගේ හිත සුව පිණිසද, මෙලොව පරලොව යහපත පිණිසද සිය ජීවිතය කැපකොට හුස්ම පොද නිදහස්කර හරින මිනිසුන් සිටින්නේ ඉතා අල්ප වශයෙනි. එවැනි සත්පුරුෂයින්ගේ ගුණ එතුමන්ලා ජීවත්වන කාලය තුළ අගැයීමට, ප්‍රශංසාවට ලක්කිරීම අපකාගේත් යුතුකම මෙන්ම වගකීම ද වන්නේය.

ශ්‍රීලංකා රාමඤ්ඤ මහා නිකායේ එක්සත් රාජධානියේ ප්‍රධාන සංඝනායක ජාත්‍යන්තර ධර්මදූත වංශප්‍රදීප පූජ්‍ය කැප්පිටියාගොඩ ගුණවංශ නාහිමියන්ට නිදුක් නිරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කරමු.

♦ **සුනිල් කැකුළාවල**
**Birmingham UK**


